# සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය
## අංශ ප්‍රධානීන් සහ කළමනාරුවන් සඳහා පුරප්පාඩු

සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය මෙරට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට සහය දැක්වීම සඳහා ප්‍රමුඛ පෙළ මූල්‍ය ආයතන 13ක් සමඟ සම්බන්ධකර ඇති රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් සහිත ආයතනයකි. ශ්‍රීඝ්‍රයෙන් වෙනස්වන වෙළඳපොළ ඉල්ලීම්, තාක්ෂණික මාරුවීම් සහ ධාරිතාමය සීමාවන් මගින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා එල්ලවන අභියෝග ජය ගනිමින්, ආර්ථික වර්ධනය සහ සමෘද්ධිය ප්‍රවර්ධනය කරන ශක්‍ය ව්‍යාපෘතීන් සඳහා මුදල් ප්‍රවාහ මත පදනම් කරගත් ණය ලබාදීම ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ණය සුරැකුම් ආයතනය ඇපකර සපයයි.

අප සොයන්නේ ශක්තිමත් අන්තර් පුද්ගල සබඳතා ඇති, සවිස්තරාත්මකව අවධානය යොමුකිරීමට හැකියාව ඇති, රහස්‍යභාවය පවත්වාගැනීමේ හැකියාව ඇති සහ ඉහළ කාර්ය සාධනයක් සහ කණ්ඩායම් සාමාජිකයින් සමග ඉලක්ක සපුරාගැනීමේ හැකියාව ඇති පුද්ගලයන්ය. ඔබ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ වර්ධනයට බලපෑම් කිරීමට සහ වේගවත් කිරීමට කැමති අපේක්ෂකයෙක් නම් අප හා එක්වන්න.

**අංශ ප්‍රධානී (කාර්ය සාධනය මත පුනර්ජනනීය වසර 03ක කොන්ත්‍රාත් පදනමට යටත්ව) | ප්‍රධාන වගකීම් හා සුදුසුකම්**

| | |
|---|---|
| **අවදානම් කළමනාකරණය අංශ ප්‍රධානී / CRO**<br>සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනයේ ඇපකර නිකුත් කිරීමේ මෙහෙයුම්වල සියලුම අවධානම් ( ණය අවදානම, වෙළඳපොළ අවදානම, ද්‍රවශීලතා අවදානම සහ උපාය මාර්ගික අවධදානම ඇතුළුව) අවම කිරීම සඳහා අවදානම් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල අරමුණු සංවර්ධනය කිරීම, මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු නායකත්ව භූමිකාවක් ඉටුකිරීම. | • CA, CIMA, ACCA, CMA හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකම් පැවතීම හෝ,<br>• පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මූල්‍ය, මූල්‍ය අවදානම් කළමනාකරණය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ මූලික උපාධියක් තිබීම හෝ ශාත්‍රපති උපාධියක් ලබා තිබීම.<br>• මූල්‍ය ක්ෂේත්‍රයේ සාම්ප්‍රදායික අවදානම් කළමනාකරණ මූලධර්ම සහ භාවිතයන් පිළිබඳව පුළුල් දැනුමක් සහිතව අවම වශයෙන් වසර 10ක පළපුරුද්ද. |
| **අභ්‍යන්තර විගණන අංශ ප්‍රධානී**<br>සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනයෙහි නියාමන අනුකූලතාවය පිළිබඳ මනා අවබෝධයක් ඇතිව සමස්ත දෙපාර්තමේන්තු ක්‍රියාවලීන් නිර්මාණය කිරීම, සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු නායකත්වය සැපයීම. | • CA, CIMA, ACCA, CMA හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම්.<br>• පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මූල්‍ය, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ශාත්‍රපති හෝ මූලික උපාධිය සම්බන්ධ මූලික උපාධියක් තිබීම අතිරේක සුදුසුකමකි.<br>• බැංකු සහ මූල්‍ය අංශවල අවම වශයෙන් වසර 10ක අභ්‍යන්තර විගණන පළපුරුද්ද. |

**කළමනාකාර තණතුරු (ස්ථිර පදනම) / ප්‍රධාන වගකීම් හා සුදුසුකම්**

| | |
|---|---|
| **කළමනාකරු – සුරැකුම් පරිපාලන**<br>සමස්ත ඇපකර පරිපාලන කාර්යයේ වගකීම් මෙහෙයුම් සහ ආමන්ත්‍රණ ගැටළු අධීක්ෂණය කරීම. මෙම තණතුරේ ප්‍රධාන වගකීම් වනුයේ, ණය සුරැකුම් සඳහා ඉදිරිපත් වන අයදුම්පත් කාලීනව සමාලෝචනය සහ අනුමැතිය දීම, ප්‍රධානය කරන ඇපකර පදනමේ උසස් තත්වයක් පවත්වාගෙන යාම, ව්‍යාපාර ඉලක්ක සාක්ෂාත් කරගැනීම, ණය සුරැකුම් පත් සම්බන්ධව සහභාගීත්ව බැංකු සමග සන්නිවේදනය කිරීම, මෙහෙයුම් අත්පොත් සංවර්ධනය කිරීම, ධාරිතා හා දැනුම වැඩිදියුණු කිරීම සඳහා කටයුතු සංවිධානය කිරීම, සමාලෝචන වගකීම් පරිපාලනය සම්බන්ධ මාසික/කාර්තු වාර්තාකරණය | • පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ගිණුම්කරණය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලන පිළිබඳව මූලික උපාධියක් හෝ ශාත්‍රපති උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ වෘත්තීය සුදුසුකම්/සාමාජිකත්වය හෝ ACCA,CIMA,CA,CMA හෝ සමාන සුදුසුකම් ලබා තිබීම.<br>• බැංකු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක පළපුරුද්දක් තිබීම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ලබාදීම සම්බන්ධයෙන් පළපුරුද්ද සහ ප්‍රවීණත්වය, බැංකු අංශයේ අවම වශයෙන් වසර 02ක කළමනාකාර මට්ටමේ තණතුරක අවම වශයෙන් වසර 02ක කටයුතු කර තිබීම |
| **කළමනාකරු – හිමිකම්**<br>මෙමගින් හිමිකම් මෙහෙයුම් අධීක්ෂණය සහ සමස්ත හිමිකම් කළමනාකරණ කාර්යයේ ගැටළු විසඳීම සිදු කරයි. මෙහි ප්‍රධාන වගකීම් වලට අයත් වන්නේ: හිමිකම් ඉල්ලීම් සමාලොචනය හා විශ්ලේෂණය කිරීම, ඵලදායී ප්‍රතිසාධන පියවර පිළිබඳ උපදෙස් ලබා දීම, කාර්යක්ෂමව හිමිකම් පියවීම් සම්බන්ධ ක්‍රියා පටිපාටි අධීක්ෂණය කිරීම, හිමිකම් සහ අයකර ගැනීමේ පවත්නා ප්‍රතිපත්ති සංශෝධනය කිරීම, අඛණ්ඩ විශ්ලේෂණය අනුකූලවීම හා වාර්තාකරණය හා අධීක්ෂණය. | • පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ගිණුම්කරණය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලන පිළිබඳව මූලික උපාධියක් හෝ ශාත්‍රපති උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ වෘත්තීය සුදුසුකම්/සාමාජික්ත්වය හෝ ACCA,CIMA,CA,CMA හෝ සමාන සුදුසුකම් ලබා තිබීම.<br>• බැංකු ක්ෂේත්‍රෙය් අවම වශයෙන් වසර 4ක පළපුරුද්ද, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ප්‍රතිසාධන හැසිරවීම පිළිබඳව ප්‍රවීණත්වය හා කළමනාකාර මට්ටමේ තණතුරක අවම වශයෙන් වසර 02ක කටයුතු කර තිබීම. |
| **කළමනාකරු – මූල්‍ය සහ ප්‍රසම්පාදන**<br>පරිපාලන ප්‍රධානියාගේ වැඩ කටයුතු වාර්තා කිරීමේදී සහ ඒවාට පහසුකම් සැලසීමේදී මූල්‍ය හා ප්‍රසම්පාදන කාර්යයන්හි සේවා සහ ක්‍රියාවලි අධීක්ෂණය කරයි. මෙහි ප්‍රධාන වගකීම්වලට ඇතුලත් වන්නේ; විස්තීර්ණ මූල්‍ය හා ප්‍රසම්පාදන වාර්තා නඩත්තු කිරීම, වාර්ෂික අයවැය සහ මූල්‍ය සැලසුම් සකස් කිරීම, සුරැකුම්පත් ගාස්තු සහ හිමිකම පියවීම සඳහා එකතු කරන ලද බිල්පත් සමාලෝචනය කිරීම, ජාතික ණය සුරැකුම් ආයතනය විසින් කරන ලද බඳුකරණය සහ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්වලට අදාළව විශේෂඥ දැනුම සහ මගපෙන්වීම සැපයීම, මූල්‍ය සහ ප්‍රසම්පාදන කළමනාකරන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම, අනුකූලතාව, වාර්තා කිරීම සහ වරින් වර සමාලෝචනය අධීක්ෂණය කිරීම. | • CA, ACCA, CIMA හෝ සමාන වෘත්තීය සුදුසුකම් පැවතීම.<br>• පිළිගත් විශ්ව විද්‍යාලයකින් මූල්‍ය, ගිණුම්කරණය පිළිබඳව මූලික උපාධියක් හෝ ශාත්‍රපති උපාධියක් හෝ ඊට සමාන ක්ෂේත්‍රයක් සුදුසුකමක් පැවතීම අමතර සුදුසුකමක් වේ.<br>• මූල්‍ය හා ප්‍රසම්පාදනය කළමනාකරනය පිළිබඳව අවම වශයෙන් වසර 05ක පළපුරුද්ද.<br>• මූල්‍ය ආයතනයක කළමනාකාර ධූරයක කටයුතු කර තිබීම අමතර සුදුසුකමකි.<br>• ගිණුම්කරණ මෘදුකාංග, මුදල් පොත්, මුදල් හුවමාරු කිරීම් සහ විවිධ මිලදී ගැනීමේ පද්ධති ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇතුළුව මූල්‍ය හා ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීම පිළිබඳ සම්පූර්ණ දැනුම සහ අත්දැකීම් පැවතීම. |

** සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවීම් අවසන් වන දිනට වයස අවුරුදු 57ට අඩු විය යුතුය*

**වේතන පැකේජය**

තෝරාගන්නා අපේක්ෂකයන් සඳහා ආකර්ෂණීය වැටුප් පැකේජ ලබා දෙනු ඇත.

**තෝරාගැනීමේ පටිපාටිය**

තෝරාගැනීම විස්තීර්ණ සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් හරහා සිදු කරන අතර, එම ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම් ලත් අපේක්ෂකයින්ට පමණක් දැනුම්දීම් කරනු ලැබේ. අදාළ තනතුර සඳහා ඔබ කැමැත්තක් දක්වන්නේනම්, අදාළ සුදුසුකම් ඔබ සතුව තිබේනම්,ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ සබඳතා තොරතුරු සමඟ සම්පූර්ණ කරනලද ජීව දත්ත පත්‍රිකාවක් (PDF) ncgi.recruitment@gmail.com විද්‍යුත් ලිපිනයට යොමුකර එහි දෘඩ පිටපතක් 2024 සැප්තැම්බර් මස 11 වන දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපැලෙන් පහත ලිපිනයට යොමු කරන්න. කරුණාකර ලියුම් කවරයේ සහ විද්‍යුත් පණිවිඩයෙහි විෂය, "NCGIL - යෙදී ඇති තනතුරේ නම" සඳහන් කරන්න.

***ලිපිනය: ජාතික ණය සුරැකුම් ආයතනය, කාමර අංක 207, මහ ලේකම් කාර්යාලය, 2 මහළ, ලෝටස් පාර, කොළඹ 01.***